කිංස්වුඩ් විද්‍යාලය - මහනුවර

Kingswood College - KANDY

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)විභාගය - 2026

General Certificate of Education (Advanced Level) Examination - 2026

12 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය - 2025 ජූලි

Grade 12 – Second Term Test – July 2025

02 S 1

රසායන විද්‍යාව - I

Time $1\frac{1}{2}$ hours

$R = 8.314 JK^{-1}mol^{-1}$

$N_A = 6.022 \times 10^{23} mol^{-1}$

$h = 6.626 \times 10^{-34} Js$

$c = 3 \times 10^{8} ms^{-1}$

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න

1. සිදුරු සහිත කැතෝඩයක් යොදා සිදු කරන ලද කාන්ස් නල පරීක්ෂණයෙන් අනාවරණය කර ගන්නා ලද්දේ
   1) ප්‍රෝටෝනය යි.
   2) X කිරණ යි
   3) ඉලෙක්ට්‍රෝනය යි
   4) හයිඩ්‍රජන් පරමාණු යි
   5) නියුට්‍රෝනය යි

2. පහත දී ඇති අනු / අයන අතරින් අනිත් ඒවාට වඩා වෙනස් හැඩයක් ඇත්තේ කුමකට ද ?
   1) $AlCl_4^-$  2) $PCl_4^+$  3) $NH_4^+$  4) $SF_4$  5) $POCl_3$

3. $(1,0,0,+\frac{1}{2})$ යන ක්වොන්ටම් අංක කුලකය සහිත ඉලෙක්ට්‍රෝනය පැවතිය නොහැකි ප්‍රභේදය වන්නේ
   1) H පරමාණුව
   2) $Li^{2+}$ අයනය
   3) He පරමාණුව
   4) $H^+$ අයනය
   5) $Li^+$ අයනය

4. පහත දී ඇති අනු අතරින් අනු දෙකෙහිම යුගල් නොවූ ඉලෙක්ට්‍රෝනය බැගින් ඇත්තේ කුමක ද?
   1) $SO_2$ සහ NO
   2) $NO_2$ සහ $N_2O$
   3) CO සහ NO
   4) $NO_2$ සහ $SO_2$
   5) $NO_2$ සහ NO

5. වැඩිම පරමාණු ගණනක් ඇත්තේ පහත සඳහන් කුමන ප්‍රභේදය තුළ ද?
   1) $H_2$ 4.0 g
   2) $Al(OH)_3$ 2.4 g
   3) $CaCO_3$ 10.0 g
   4) $CO_2$ 0.44 g
   5) $C_6H_{12}O_6$ 18 g

6. සාන්ද්‍රණය 0.02 $moldm^{-3}$ වන $Al(NO_3)_3$ ද්‍රාවණ 50 $cm^3$ සහ සාන්ද්‍රණය 0.03 $moldm^{-3}$ වන $Mg(NO_3)_2$ ද්‍රාවණ 50 $cm^3$ එකිනෙක සමඟ මිශ්‍ර කර නව ද්‍රාවණයක් සාදන ලදී. මෙම නව ද්‍රාවණයේ හි N සංයුතිය ppm වලින් කොපමණද?
   1) 42  2) 168  3) 420  4) 840  5) 1680



Scanned with CamScanner

7. දෙන ලද පදාර්ථයක ඝන අවස්ථාව සහ වායු අවස්ථාව නිවැරදි ව සංසන්දනය කර ඇත්තේ පහත දැක්වෙන කුමන පිළිතුරේ ද

1) ඝන අවස්ථාවට වඩා වායු අවස්ථාවේ පදාර්ථයේ අංශු අතර ආකර්ෂණය වැඩි ය
2) ඝන අවස්ථාවේ දී අංශුවලට එක මත එක ලිස්සා යා හැකි අතර වායු අවස්ථාවේ අංශුවලට සිසි සේ චලනය විය හැකිය
3) ඝන අවස්ථාවට වඩා වායු අවස්ථාවේ පදාර්ථයේ ඝනත්වය අඩු ය
4) පදාර්ථයේ පරිමාව ඝන අවස්ථාවේ දී නිශ්චිත අගයක් වන අතර වායු අවස්ථාවේ පරිමාව නිශ්චිත අගයක් නොවේ
5) ඝන අවස්ථාවේ දී අංශුවලට පීඩනයක් ඇති කළ නොහැකි අතර වායු අවස්ථාවේ අංශුවලට පීඩනයක් ඇති කළ හැකි ය

8. පහත දී ඇති අනුවේ a,b,c,හා d ලෙස නම් කර ඇති බන්ධනවල දිග වැඩිවන නිවැරදි පිළිවෙල වන්නේ

$$CH_3-C\equiv C-CH=CH_2$$

a b c d

1) b<c<d<a  2) b<c<a<d  3) b<d<c<a  4) b<d<a<c  5) c<b<d<a

9. 300 K උෂ්ණත්වයක දී සහ 1atm පීඩනයක දී පහත දැක්වෙන කුමන වායුව වැඩිම වර්ග මධ්‍යන්‍ය මූල ප්‍රවේගයක් දක්වයි ද?

1) $CO_2$  2) $N_2$  3) He  4) Ne  5) $F_2$

10. සංයුතිය 104 ppm වන $Cr^{3+}$ ද්‍රාවණයකින් $1.0 dm^3$ සෑදීමට අවශ්‍ය වන $CrCl_3$ ස්කන්ධය වන්නේ (Cr=52, Cl=35.5) ද්‍රාවණයේ ඝනත්වය $1.0\ g\ mol^{-1}$

1) 0.4 g  2) 0.112 g  3) 0.317 g  4) 0.28 g  5) 0.48 g

11. පරිමාව $4.157\ dm^3$ වන දෘඪ සංවෘත බඳුනක් තුල $27^0C$ හි සහ $5.4 \times 10^5$ Pa පීඩනයක පවතින Ne,$CO_2$ සහ $H_2$ යන වායුවල සම මවුලික මිශ්‍රණයක් අඩංගු වේ. බඳුන තුල $H_2$ හි ආංශික පීඩනය කොපමණ ද?

1) $1.8 \times 10^5$ Pa
2) $6 \times 10^5$ Pa
3) $6 \times 10^4$ Pa
4) $9 \times 10^4$ Pa
5) $1.8 \times 10^4$ Pa

12. වායුමය පද්ධතියක ඇති වායු මිශ්‍රණයක $H_2$ හා $O_2$ වායු මවුල අනුපාතය 2:1 වන ලෙස අඩංගු වේ. $H_2$ හා $O_2$ , ප්‍රතික්‍රියා කර පහත පරිදි ජල වාෂ්ප නිපදවීම සිදුවේ

$$2H_{2(g)} + O_{2(g)} \longrightarrow 2H_2O_{(g)}$$

ප්‍රතික්‍රියාව සිදු වීමට පෙර පද්ධතියේ පීඩනය 0.8 atm ද උෂ්ණත්වය 20°C ද වේ . උෂ්ණත්වය 120°C වීමෙන් පසුව ඉහත ප්‍රතික්‍රියාව සිදු වේ නම් 120°C දී අවසාන පද්ධතියේ පීඩනය atm වලින්

1) 0.400  2) 0.708  3) 0.787  4) 800  5) 0.348

13. ඔක්සිජන් හි ස්කන්ධ ප්‍රතිශතය ඉහළ ම වන්නේ පහත සඳහන් සංයෝග අතරින් කුමක ද?

1) $SO_2$  2) $NO_2$  3) $CO_2$  4) MgO  5) $Na_2O$



Scanned with CamScanner

14. $CO_2$, $CO$, $CO_3^{2-}$, $C_2O_4^{2-}$ යන ඒවායේ C හි විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙල වන්නේ

1) $C_2O_4^{2-} < CO_3^{2-} < CO_2 < CO$
2) $C_2O_4^{2-} < CO < CO_3^{2-} < CO_2$
3) $C_2O_4^{2-} < CO_3^{2-} < CO < CO_2$
4) $CO_3^{2-} < CO < C_2O_4^{2-} < CO_2$
5) $CO_3^{2-} < C_2O_4^{2-} < CO < CO_2$

15. එක්තරා දෘඩ සංවෘත බඳුනක් තුල $H_2$ වායුව 1 mol අඩංගු වේ. මෙම වායුවේ උෂ්ණත්වය දෙගුණයක් කළ විට ලැබෙන වායුමය පද්ධතිය පිළිබඳ ව පහත සඳහන් කුමක් නිවැරදි වේද ?

1) වායුවේ පරිමාව වැඩි වේ.
2) වායුවේ පීඩනය අඩු වේ.
3) වායු අණුවල වර්ග මධ්‍යනා මූල ප්‍රවේගය දෙගුණ වේ.
4) වායු අණුවල මධ්‍යනා චාලක ශක්තිය ඉහළ යයි.
5) වායු අණු අතර පවතින මධ්‍යනා දුර වැඩි වේ.

16. HCl,HBr,HI,HF හි තාපාංක වැඩිවන පිළිවෙල වන්නේ

1) HCl < HBr < HI < HF
2) HCl < HBr < HF < HI
3) HI < HBr < HCl < HF
4) HF < HI < HCl < HBr
5) HF < HCl < HI < HF

17. $K_2Cr_2O_7$ 11.76 g ජලය 500.0 $cm^3$ ක දිය කර සාදාගත් ද්‍රාවණයෙන් 25.0 $cm^3$ කට වැඩිපුර KI එකතු කරන ලදී. එහිදී පිටවූ $I_2$ $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමග අනුමාපනය කරන ලදී . වැය වූ $Na_2S_2O_3$ පරිමාව 30 $cm^3$ ක් නම් $Na_2S_2O_3$ ද්‍රාවණයේ සාන්ද්‍රණය mol $dm^{-3}$ වලින් ($K_2Cr_2O_7$ = 294)

1) 0.04
2) 0.08
3) 0.20
4) 0.40
5) 0.80

18. $BaCl_2.XH_2O$ වලින් 24.4 g ජලය තුළ දියකර ද්‍රාවණ 1.0 $dm^3$ පිළියෙල කරන ලදී. මෙම ද්‍රාවණයෙන් 100 $cm^3$ සමග ප්‍රතික්‍රියාවට 1.0 M $AgNO_3$ වලින් 20 $cm^3$ වැයවුණි. X හි අගය වන්නේ,

1) 2
2) 3
3) 4
4) 5
5) 6

19. ලෝහ ඔක්සයිඩයක සූත්‍රය $A_2O_3$ වේ. $A_2O_3$ හයිඩ්‍රජන් සමග ඔක්සිහරණය කළ විටදී A සහ $H_2O$ පමණක් ලැබේ. $A_2O_3$ වලින් 0.1596 g පූර්ණව ඔක්සිහරණයට $H_2$ 6.00 mg අවශ්‍ය විය. A හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය වන්නේ,

1) 55.8
2) 48
3) 27
4) 51
5) 64

20. M වායුව -3°C හිදී ලබා ගන්නා වර්ග මධ්‍යනා ප්‍රවේගය $CO_2$ වායුව 73°C හිදී ලබා ගනී. M වායුව පහත සඳහන් වායුවලින් කුමක් විය හැකි ද

1) $NO_2$
2) $NH_3$
3) CO
4) $H_2S$
5) $SO_2$

21. $2H_2S + SO_2 \rightarrow 3S + 2H_2O$ යන ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් සත්‍ය වගන්තිය කුමක් ද?

1) මෙය ද්විධාකරණ ප්‍රතික්‍රියාවකි
2) ප්‍රතික්‍රියාවට ඉලෙක්ට්‍රෝන හතරක් සහභාගි වී ඇත
3) $H_2S$ ඔක්සිහරණය වී ඇත
4) $SO_2$ ඔක්සිහරණය වී ඇත
5) $O_2$ ඔක්සිහරණය වී ඇත



Scanned with CamScanner

**27.** පහත දැක්වෙන්නේ A සහ B යන වායු ස්කන්ධ දෙකක් සඳහා අඳින ලද $\frac{1}{V}$ එදිරියෙන් $P$ ප්‍රස්තාර දෙකකි. A ප්‍රස්තාරය $T_A$ නියත උෂ්ණත්වයකට සහ B ප්‍රස්තාරය $T_B$ නියත උෂ්ණත්වයකට අනුරූප වේ. මෙම ප්‍රස්තාර දෙක පිළිබඳ ව දී ඇති ප්‍රකාශ අතරින් ගැලපෙන ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ.




**a)** ප්‍රස්තාර දෙක එක ම වායුවේ සමාන ස්කන්ධ දෙකක් සඳහා විය හැකි අතර $T_A < T_B$

**b)** $T_A = T_B$ ලෙස පවතින වෙනස් වායු දෙකක සමාන ස්කන්ධ සඳහා විය හැකි අතර A වක්‍රය අනුරූපවන වායුවේ මවුලික ස්කන්ධය B වක්‍රයට අනුරූපවන වායුවේ මවුලික ස්කන්ධය වඩා ඉහළ වේ

**c)** $T_A = T_B$ ලෙස පවතින එක ම වායුවක වෙනස් ස්කන්ධ සඳහා විය හැකි අතර A වක්‍රය අනුරූපවන වායුවේ ස්කන්ධය B වක්‍රයට අනුරූපවන වායුවේ ස්කන්ධයට වඩා ඉහළ වේ

**d)** ප්‍රස්තාරය, දෙක වෙනස් වායු දෙකක සමාන මවුල ගණනක් සඳහා විය හැකි අතර $T_A > T_B$

**28.** ආවර්තිතා වගුව සම්බන්ධව අසත්‍ය ප්‍රකාශය /ප්‍රකාශ මොනවා ද ?

**a)** මූලද්‍රව්‍ය ඒවායේ පරමාණුක ක්‍රමාංක ආරෝහණය වන පිළිවෙලට සකසා ඇත .

**b)** හතරවන ආවර්තයේ මූලද්‍රව්‍ය 18 ක් පවතී.

**c)** එකම කාණ්ඩයට අයත් සියළු මූලද්‍රව්‍ය වල භෞතික හා රසායනික ගුණ සියල්ල සමානවේ.

**d)** 1 සහ 2 කාණ්ඩවල මූලද්‍රව්‍ය ධන අයන සෑදීමට නැඹුරු වේ.

**29.** ලුවිස් අම්ල ලෙස ක්‍රියා කරන අණු / අයන වන්නේ

**a)** $NH_3$ **b)** $AlCl_3$ **c)** $BF_3$ **d)** $H_3O^+$

**30.** $CaCO_3 \rightarrow CaO + CO_2$ යන තාප වියෝජන ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ ප්‍රකාශ සත්‍ය වේ ද?

**a)** මෙය රෙඩොක්ස් ප්‍රතික්‍රියාවකි

**b)** $CaCO_3$ 100g තාප වියෝජනයෙන් CaO 56g ලැබේ

**c)** $CaCO_3$ 1g තාප වියෝජනයෙන් $CO_2$ මවුල 0.01 ක් ලැබේ

**d)** $CaCO_3$ හි වියෝජන උෂ්ණත්වය $MgCO_3$ හි වියෝජන උෂ්ණත්වයට වඩා අඩු ය

**31.** අන්තර් අණුක ආකර්ෂණ බල ලෙස හයිඩ්‍රජන් බන්ධන පවතින ද්‍රව්‍ය වන්නේ

**a)** $CH_3OH_{(l)}$ **b)** $I_{2(s)}$ **c)** $Br_{2(l)}$ **d)** $NaCl_{(aq)}$

**32.** පරිපූර්ණ වායු සම්බන්ධව අසත්‍ය ප්‍රකාශය /ප්‍රකාශ මොනවා ද ?

**a)** එකම උෂ්ණත්වය හා එකම පීඩනය යටතේ පවතින ඕනෑම පරිපූර්ණ වායුවක මවුල එකක පරිමාව සමාන වේ.

**b)** පරිපූර්ණ ලෙස හැසිරෙන වායුවක අණු වායුව අඩංගු භාජනයේ බිත්ති මත ඇති කරන ගැටුම් පූර්ණ ප්‍රත්‍යස්ථ වේ.

**c)** නියත පීඩනයක් යටතේ පවතින නිශ්චිත ස්කන්ධයක් සහිත පරිපූර්ණ වායු නියැදියක උෂ්ණත්වය 50°C සිට 100 °C දක්වා වැඩි කල විට එහි පරිමාව දෙගුණයකින් වැඩිවේ.

**d)** වායු ස්කන්ධයක සමස්ත චාලක ශක්තිය වායුවේ නිරපේක්ෂ උෂ්ණත්වයට අනුලෝම ව සහ වායුවේ මවුලික ස්කන්ධයට ප්‍රතිලෝම ව සමානුපාතික වේ.



Scanned with CamScanner

22. A සහ B යන වායු වර්ග දෙක දෘඪ සංවෘත බඳුනක 300k උෂ්ණත්වයක පවතී. මෙම තත්ව යටතේ වායු වර්ග දෙකෙහි ආංශික පීඩන සමාන වේ. උෂ්ණත්වය 400k දක්වා ඉහල නැංවූ විට වායු පහත ආකාරයට සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කරයි. ප්‍රතික්‍රියාවට පෙර පද්ධතියේ පීඩනය P නම් ප්‍රතික්‍රියාව අවසානයේ දී පද්ධතියේ මුළු පීඩනය කොපමණ ද?

$$2A + B \rightarrow 2C + 3D$$

1) $P$ 2) $\frac{20P}{3}$ 3) $\frac{5p}{3}$ 4) $2P$ 5) $5P$

23. පහත තුලිත නොවූ ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් කුමක්/කුමන ප්‍රකාශ සත්‍ය වේ ද?

$$xO_2^-(aq) + yH_2O(l) \rightarrow aO_2\,(g) + bOH^-$$

A. එය ද්විධාකරණ ප්‍රතික්‍රියාවකි

B. සුපර් ඔක්සයිඩ ($O_2^-$) අයනයෙහි ඔක්සිජන් හි ඔක්සිකරණ අංකය − ½ වේ

C. සුපර් ඔක්සයිඩ ($O_2^-$) අයනයෙහි එක් ඔක්සිජන් පරමාණුවක ඔක්සිකරණ අංකය 0 වන අතර අනෙක් පරමාණුවේ ඔක්සිකරණ අංකය -1 වේ

D. $O_2^-$ හා $H_2O$ අතර ස්ටොයිකියෝමිතිය 2:1 වේ

1) A පමණක් නිවැරදි වේ
2) A,B හා D පමණක් නිවැරදි වේ
3) A B පමණක් නිවැරදි වේ
4) A,C හා D පමණක් නිවැරදි වේ
5) B , D පමණක් නිවැරදි වේ

24. $CH_3CH{=}CH{-}C{\equiv}H$ අණුව පිළිබඳ ව මින් කුමක් කුමන ප්‍රකාශය අසත්‍ය වේ ද?

1) සියළු කාබන් පරමාණු එකම සරළ රේඛාවක නොපිහිටයි.
2) සියළු කාබන් පරමාණු එකම තලයක පිහිටයි.
3) සියළු පරමාණු එකම තලයක පිහිටයි.
4) අණුව තුල sp, $sp^2$, $sp^3$ මුහුම්කරණ අවස්ථා සහිත කාබන් පරමාණු ඇත.
5) අණුව තුල $sp^2$ මුහුම්කරණ අවස්ථා සහිත කාබන් පරමාණු දෙකක් ඇත.

❖ **අංක 25 සහ 32 තෙක් වූ එක් එක් ප්‍රශ්නයේ දක්වා ඇති a, b, c, හා d යන ප්‍රතිචාර අතරින් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේදැයි තෝරාගන්න.**

(a) හා (b) පමණක් නිවැරදි නම් ........................................................ 1

(b) හා (c) පමණක් නිවැරදි නම් ........................................................ 2

(c) හා (d) පමණක් නිවැරදි නම් ........................................................ 3

(a) හා( d) පමණක් නිවැරදි නම් ........................................................ 4

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ..........5 මින ද ලකුණු කරන්න.

25. PV = nRT යන සම්බන්ධතාවය පිලිපදින වායුවක ලක්ෂණයක් /ලක්ෂණ වන්නේ

a) වායුවේ පරිමාව නොගිනිය හැකි තරම් කුඩා වීම.
b) නියත උෂ්ණත්වයේ දී වායුවේ පීඩනයේ සහ පරිමාවේ ගුණිතය ඕනෑම උෂ්ණත්වයක් සඳහා නියත අගයක් වීම.
c) වායුවේ පරිමාව වායුවේ නිරපේක්ෂ උෂ්ණත්වය ට අනුලෝම ව සමානුපාතික වීම.
d) වායුව මගින් ඇති කල හැකි සමස්ත පීඩනය වායු අංශු ඒවා අඩංගු භාජනයේ බිත්ති මත ගැටීමෙන් ඇති කරන පීඩනයට සමාන වීම.

26. පහත සඳහන් පරමාණු /අයන අතරින් වියුග්ම ඉලෙක්ට්‍රෝන සහිත ප්‍රභේදය / ප්‍රභේද වන්නේ

a) $Mn^{7+}$ b) $Zn^{2+}$ c) $Mn^{2+}$ d) $Ti^{2+}$



Scanned with CamScanner

අංක 33 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන පරිදි( 1), (2), (3), (4) හෝ (5) යන ප්‍රතිචාරවලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍යවේ. | සත්‍ය වන අතර පළමු වැනි ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි |
| (2) | සත්‍යවේ. | සත්‍ය වන නමුත් පළමු වැනි ප්‍රකාශය නිවැරදිව පහදා නොදෙයි |
| (3) | සත්‍යවේ. | අසත්‍යවේ |
| (4) | අසත්‍යවේ. | සත්‍යවේ |
| (5) | අසත්‍යවේ. | අසත්‍යවේ |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| **33.** යම් අණුවක් ධ්‍රැවීය ද නිර්ධ්‍රැවීය ද යන බව තීරණය කිරීමට ද්වි ධ්‍රැව ඝූර්ණය යොදා ගත හැකිය. | අණුවක ජ්‍යාමිතිය තීරණය කිරීමට ද්වි ධ්‍රැව ඝූර්ණය යොදා ගත හැකිය. |
| **34.** $BeCl_2$ අණුවේ ඇති ප්‍රාථමික අන්තර්ක්‍රියාව සහසංයුජ බන්ධන වේ. | $BeCl_2$ අණුවේ Be හි ඔක්සිකරණ අංකය +2 වේ. |
| **35.** මූල ද්‍රව්‍යයක විද්‍යුත් සෘණතාවයේ විශාලත්වය කෙරෙහි එහි මුහුම්කරණය බලනොපායි. | මූල ද්‍රව්‍යයක විද්‍යුත් සෘණතාවය යනු එහි බන්ධන ඉලෙක්ට්‍රෝන තමා දෙසට ඇද ගැනීමට ඇති ලැදියාවයි. |
| **36.** 298 K දී සංශුද්ධ ජලයෙහි සාන්ද්‍රණය 55.55 $mol\ dm^{-3}$ වේ. | සාන්ද්‍රණය උෂ්ණත්වය මත රඳා පවතී. |
| **37.** පරිපූර්ණ වායු අණුවක් බඳුනේ බිත්තිය මත හැපී ආපසු හැරෙන විට අණුවේ ගම්‍යතාවය වෙනස් නොවේ. | පරිපූර්ණ වායු අණු විසින් ඇති කරන ගැටුම් පූර්ණ ප්‍රත්‍යස්ථ වේ. |
| **38.** විකිරණශීලී සමස්ථානිකයක් විසින් α අංශුවක් ඉවත් කළ විට ලැබෙන ඵලයේ ස්කන්ධ ක්‍රමාංකය හතරකින් අඩු වේ. | α අංශුවක් He න්‍යෂ්ටියට සමාන වේ. |
| **39.** H පරමාණුවේ අරය $Li^{2+}$ අයනයේ අරයට සමාන වේ. | H පරමාණුවේ සහ $Li^{2+}$ අයනයේ ඉලෙක්ට්‍රෝන එක බැගින් ඇත . |
| **40.** $NH_3$ ඔක්සිකරණයට භාජනය කළ නොහැක. | නයිට්‍රජන්ට ලබා ගත හැකි අවම ඔක්සිකරණ අංකය -3 කි |



Scanned with CamScanner